සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

නාට්‍ය හා රංගකලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

## II කොටස

උපදෙස්:

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A - දේශීය නාට්‍ය කලාව

**1.** (i) ශාන්තිකර්ම යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද යි සැකෙවින් පහදන්න. (ලකුණු 04 යි.)

(ii) නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත බෞද්ධ පූජා කර්ම **තුනක්** සඳහන් කොට, කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි.)

(iii) සිංහල නාට්‍යය පෝෂණයෙහි ලා ලක්දිව ශාන්තිකර්මවලින් ලබාගත හැකි පිටිවහල සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) නූර්ති නාට්‍ය කලාවේ පිරිහීමත් සමග ම සිංහල නාට්‍යය වෙනත් මඟකට යොමු කළ පුරෝගාමී නාට්‍යකරුවෝ දෙදෙනා කවරහු ද? (ලකුණු 04 යි.)

(ii) ඔවුන්ගේ නාට්‍ය, නාඩගම් හා නූර්තිවලින් වෙනස් වූයේ කෙසේ ද? (ලකුණු 05 යි.)

(iii) එතැන් සිට 1956 දක්වා නූතන සිංහල නාට්‍යයේ ඉතිහාසය සැකෙවින් දක්වන්න. (ලකුණු 06 යි.)

**3.** (a) ප්‍රශ්නයට **හෝ** (b) ප්‍රශ්නයට **හෝ** පිළිතුරු සපයන්න.

(a) (i) සරච්චන්ද්‍ර පවසන අන්දමට ඔහුගේ 'හස්තිකාන්ත මන්තරේ' නාට්‍යයට මූලාශ්‍රය වූ සංස්කෘත නාට්‍යය කුමක් ද? (ලකුණු 04 යි.)

(ii) සරච්චන්ද්‍රගේ නාට්‍යය එයින් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 05 යි.)

(iii) 'හස්තිකාන්ත මන්තරේ' නාට්‍යයේ නාට්‍යමය ගුණය පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 06 යි.)

(b) (i) 'සුබ සහ යස' නාට්‍යයට මුල් වූ පුරාවෘත්තය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉතිහාස කතාවක් පදනම් කරගෙන නාට්‍යයක් රචනා කිරීමේ දී නාට්‍යකරු මුහුණ දෙන අභියෝග 'සුබ සහ යස' නාට්‍ය ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

(iii) 'සුබ සහ යස' නාට්‍යය ලැබූ ප්‍රේක්ෂක ප්‍රතිචාර පිළිබඳ විචාරයක් කරන්න. (ලකුණු 06 යි.)

## B - විදේශීය නාට්‍ය කලාව

**4.** (i) 'ඇන්ටිගනී' නාට්‍යයේ ගැටුම් අවස්ථා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 04 යි.)

(ii) එම ගැටුම් අවස්ථා නාට්‍යය ඛේදජනක අවසානයක් කරා ගෙන යන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 05 යි.)

(iii) 'ඇන්ටිගනී' නාට්‍යයෙන් සොෆොක්ලීස් දීමට අපේක්ෂා කළ පණිවිඩය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) 'අභිඥානශාකුන්තලයට' මූලාශ්‍රය වූ ආඛ්‍යානය කෙටියෙන් දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) එයට කාලිදාස කර ඇති වෙනස්කම් පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) "අභිඥානශාකුන්තලය නූතන වේදිකාවට ගෙන ඒමට පහසු නාට්‍යයක් නොවේ." විමසන්න. (ලකුණු 06 යි.)

**6.** (i) යුරෝපයේ නූතන යථාර්ථවාදී නාට්‍යයේ පුරෝගාමීහු දෙදෙනා කවරහු ද? (ලකුණු 04 යි.)

(ii) 'රූකඩ ගෙදර' නාට්‍යය කෙතෙක් දුරට යථාර්ථවාදී නාට්‍යයක් ද යි විමසන්න. (ලකුණු 05 යි.)

(iii) 'රූකඩ ගෙදර' නාට්‍යයේ නෝරාගේ ක්‍රියාකලාපය යුක්තිසහගත ද යි විමසන්න. (ලකුණු 06 යි.)

※※※